

# වනජීවි සංරක්ෂණය හා සංවර්ධනයට දායකත්වය

දයානන්ද කාරියවසම්

අතීතයේදී පාරිසරික ගැටළු මතු වූයේ සීඝ්‍ර ජනගහන ප්‍රසාරණය හේතුවෙනි. මෑතකදී සිදු කරන ලද සමීක්ෂණ අනුව මුලු ජනගහනය මිලියන 20 පමණ වන අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 2.1% ක් බව පෙන්නුම් කරයි. එහෙත් බටහිර රටවල ජනඝනත්වය අවම තත්ත්වයක පැවතියද පරිසර ගැටලු උග්‍ර තත්වයකට පත්ව තිබේ. වසර ගණනාවක සිට පරිසරය පිළිබඳව නොසලකා හැර කටයුතු කිරීමෙන් ස්වභාවික සම්පත් අද ඵල ප්‍රයෝජනයක් ගත නොහැකි මට්ටමකින් විනාශ වී ඇත. මේ හේතුවෙන් දුප්පත් රටවල දරිද්‍රතාවය පිළිබඳ ප්‍රශ්නයද තවදුරටත් උග්‍ර වේ. එමෙන්ම දරිද්‍රතාවය දෘශ්‍යමාන වේ.


ශ්‍රී ලංකාවේ මුලු භූමි ප්‍රමාණයෙන් 30% ක් පමණ අද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලන කරනු ලබන අතර වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව පමණක් මුලු භූමි ප්‍රමාණයෙන් 13% ක් සංරක්ෂණය කරමින් භාරධූර කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. එහෙත් අපට තවමත් සංරක්ෂණ අරමුණු කරා සෘජු ලෙස එළඹීමට නොහැකි වී තිබේ. තුන්වන ලෝකයේ රටක් ලෙස ශ්‍රී ලංකාවේ සීඝ්‍ර ජනගහන වර්ධනය හේතුවෙන් මෙරට වර්ග කිලෝමීටරයට ජනඝනත්වය 300 ක් පමණ වන බව සමීක්ෂණවලින් පෙන්නුම් කෙරේ. මේ නිසා අපේ රක්ෂිත ප්‍රදේශ ප්‍රමාණාත්මකව වැඩිකර ගැනීමට නොහැකි තත්ත්වයක් මතුව ඇත. දැනටමත් මෙහි පූර්ව ලක්ෂණයක් ලෙස රක්ෂිත ප්‍රදේශ සීමාවන් සහ ගම්මාන ආරම්භ වන සීමාවන් හඳුනා ගැනීම අපහසු වී තිබේ. මේ තත්ත්වය උදාව තිබෙන්නේ ගම්මානවල වැසියන්ගේ දුප්පත්කම හේතුවෙන් ජීවත්වීම සඳහා රක්ෂිත ප්‍රදේශ බලයෙන් අත්පත් කර ගැනීම නිසයි. සංරක්ෂණ ක්‍රියාමාර්ග දියත් කිරීමේදී අපට දරිද්‍රතාවය පිළිබඳ පාරිසරික පැතිකඩ හඳුනා ගැනීම අවශ්‍ය වේ. තුලනාත්මක නොවන සංවර්ධන ක්‍රියාදාමයේදී අවුරුදු ගණන් පාරිසරික ප්‍රශ්න නොසලකා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස අද මෙවැනි අර්බුදවලට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මුහුණ පා සිටියි.

දේශීය සංරක්ෂණ වේදීන්ගේ ප්‍රධාන අභිප්‍රාය වී තිබෙන්නේ මානව බලපෑම් අවම මට්ටමක පවතින එසේම ශාක සහ සත්ව ප්‍රජාවගේ පරිසර තත්ත්වයන් මනාව හතවුරු වන්නා සේම ඔවුන්ට මනා ආරක්ෂාවක් තිබෙන රක්ෂිත කලාප පද්ධතියක් මෙරට ස්ථාපිත කිරීමයි. එවිට මෙම රක්ෂිත කලාප පද්ධතිය තුළ වනජීවීන්ගේ පැවැත්ම මනාව තහවුරු කර විශේෂයෙන්ම දැනට රක්ෂිත ප්‍රදේශවලින් පිටත සිටින සංචාරන සතුන්ගේ ආරක්ෂාව තහවුරු කර පාරිසරික ප්‍රශ්නයන්ට දිගු කාලීන විසඳුම් ලබාදීමට සහ වඳවීයාමේ තර්ජනයට මුහුණ පා සිටින විශේෂ කීපයක් හෝ ආරක්ෂා කරගැනීමට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හැකියාව ලැබේ. මෙය ඉතා දුෂ්කර කාර්යයකි. රජය මගින් වනජීවී සහ පරිසර සංරක්ෂණය සඳහා පනවා ඇති නීතිරීති උල්ලංඝණය කිරීම එනම් මිනිසුන් වනජීවි රක්ෂිත තුළට බලයෙන් පිවිසීම, වනජීවි දඩයම්, රක්ෂිත ප්‍රදේශ තුළට තණ කැවීම සඳහා ගවයන් ඇතුළු කිරීම, නීති විරෝධී ලෙස දැව කැපීම, රක්ෂිත ප්‍රදේශ තුළ ගිනි තැබීම් සිදු කිරීම ආදිය හේතුවෙන්ද මෙරට වනජීවි සංරක්ෂණයට විශාල වශයෙන් තර්ජනය සිදුවේ. මේ නිසා සංරක්ෂණයේ අවශ්‍යතාවය පිළිබඳව මහජනතාවගේ අවධානය යොමු කිරීමද අත්‍යාවශ්‍ය වී තිබේ. වනජීවීන් සහ රක්ෂිත කලාප ආරක්ෂා කරගැනීම යථාර්ථයක් බවට පත්කර ගැනීමට මෙය සත්‍ය වශයෙන්ම සිදුවිය යුත්තකි.

අපි සංරක්ෂණය කරනු ලබන සෑම ජීවී විශේෂයක් මෙන්ම ග්‍රාමීය ජනතාවගේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා රැකියා අවස්ථාවන් නිර්මාණය කිරීමද වැදගත් වේ. දඩයම සහ බලයෙන් රක්ෂිත ප්‍රදේශ වලට මිනිසුන් ඇතුළුවීම වැළැක්වීම සඳහා මිනිසුන්ට විකල්ප ජීවිකාවන් හඳුන්වා දීම අවශ්‍ය වේ. මෙහිදී කාබනික ගොවිතැන, උයන් පාලනය වැනි අවස්ථාවන් හඳුන්වා දිය හැකිය. රක්ෂිත ප්‍රදේශ වලින් පිටත අත්හැර දමා ඇති ඉඩම් පුනරුත්තාපනය කර දැව ශාක වගා කිරීමටත් ගව පාලනයටත් භාවිතා කළ හැකිය. ජනගහන වර්ධනය හේතුවෙන් අද ශ්‍රී ලංකාවේ අලි පරපුර සඳහා ද වාසස්ථාන හිඟයක් පවතී. අලින් වැනි සංචරනයට හුරු සතුන් සඳහා අපගේ රක්ෂිත භූමි ප්‍රමාණවත් නොවේ. මෙලෙස යෝග්‍ය ඉඩම් ප්‍රායෝගික ලෙස යොදා ගැනීම සම්පත් වඳවී යාමේ තර්ජනය වැළැක්වීමේ ප්‍රයත්නයක් ලෙසද සැලකිය හැකිය. මෙහිදී රක්ෂිත කලාප ආශ්‍රිතව ජීවත් වන ජනතාව සංරක්ෂණය කෙරෙහි පෙළඹවීම සඳහා ඔවුනගේ දුප්පත්කම තුරන් කරගැනීම සඳහා කිසියම් ප්‍රයෝජනයක් ද ලැබීම බලාපොරොත්තු වේ. මේ නිසා ඔවුන් තුළ වන ජීවීන් යනු සම්පතක් යන හැඟීම ඇති කළ යුතුවේ.











රජය ගත් එක් වැදගත් පියවරක් ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව එකම අමාත්‍යාංශයක් යටතට එනම් පරිසර සහ ස්වභාව සම්පත් අමාත්‍යාංශය යටතට පත්කිරීම සැලකිය හැකිය. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවද මෙම අමාත්‍යාංශය යටතට ගත්තේ නම් එයද තවදුරටත් වැදගත් වේ. වන සම්පත් වෙනුවෙන් රජයේ ප්‍රතිපත්තියද පැහැදිලිය. පරිසරය සඳහා රජය මූලිකත්වය දී තිබේ. එසේම අමාත්‍යාංශය භාර ඇමතිවරයා වශයෙන් ගරු රුක්මන් සේනානායක මහතා වැනි පරිසරය සහ වනජීවීන් පිළිබඳව සංවේදී පුද්ගලයෙකු පත් කිරීමද සුබ නිමිත්තක් ලෙසද දැකිය හැකිය. මේ හේතූන් නිසා පරිසරය සහ සංරක්ෂණය පිළිබඳව යහපත් දේ සිදුවෙමින් පවතින බව කාහටත් පැහැදිලි වේ.


අප අද මුහුණ දෙන සංරක්ෂණ ගැටලුවක් වන්නේ අලි මිනිස් ගැටුම වර්ධනය වීමයි. අද ලෝකයේ අලින් අතරින් ආසියාතු අලියා වඩාත්ම තර්ජනයට භාජනය වූ ජීවී විශේෂයක් ලෙස පිළිගැනේ. දැනට ලෝකයේ ආසියාතු අලින් 40,000ක් පමණ ජීවත්වන අතර එයින් 10% ක් පමණ ශ්‍රී ලංකාවේ ජීවත්වෙති. ශ්‍රී ලංකාවේ අලින් ජීවත් වන වාස භූමි වල විශාල ප්‍රමාණයක් අද කෘෂිකාර්මික ප්‍රදේශ වේ. මේ නිසා අලින්ට තම නිජබිම් අහිමිවීමේ සහ ඔවුන්ගේ ජීවිත අහිමිවීමේ තර්ජනයකට ඔවුහු මුහුණ පා සිටිති. මේ නිසා සංවර්ධනය හේතුවෙන් වැඩි වශයෙන්ම අසරණ තත්ත්වයට පත්වන සත්ත්ව විශේෂය ලෙස අලියා හඳුන්වාදිය හැකියි. මේ අනුව අලින්ගේ නිජබිම් සුරක්ෂිත කිරීම ඉතාමත් වැදගත් වේ. ඔවුන්ගේ නිජබිම් කුඩා කැබලි බවට පත් නොකර ඒවා තහවුරු කළ යුතුයි. අලින් එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට මාරු වන අලිමංකඩ යා කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව කුඩා රටක් වුවත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙසේ අලින් වැඩි වශයෙන් ගැවසෙන ප්‍රදේශ හඳුනාගෙන නව ජාතික වනෝද්‍යාන ලෙස නම් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව මින්නේරිය ගිරිතලේ රක්ෂිතය යාකර කවුඩුල්ල නව ජාතික විනෝද්‍යානය නම් කළ අතර උඩවලව සහ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යාන යාකර වන මං පෙතක් ප්‍රකාශයට පත් කිරීමටත් කටයුතු කර තිබේ. එසේම විල්පත්තු ජාතික වනෝද්‍යානය සහ පල්ලේකැලේ අභය භූමිය සම්බන්ධ කර වන පෙත් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කර තිබේ. වන මං පෙත් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව කිසිවකුගෙන් විරෝධයක් මතු නොවන්නේ අලින්ගේ පැවැත්ම සඳහා මෙය සිදු කළ යුතුම කාර්යයක් වන බැවිනි. නමුත් මෙම වැඩ පිළිවෙල පමණක්ම අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. අලි මරණවලින් වැඩිම ප්‍රමාණයක් සිදුව තිබෙන්නේ වෙඩි තැබීමෙනි. අලි සංරක්ෂණය කිරීමේ දිගු කාලීන පියවරක් වශයෙන් අලින් සහ මිනිසුන් ජීවත් වන ප්‍රදේශවල මූලාශ්‍ර සොයාගෙන දෙපිරිසට එම ප්‍රදේශයන්හි සුහදශීලි අසල්වාසීන් ලෙස ජීවත්වීමට හුරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලැස්වීම අලි සංරක්ෂණය කිරීමේ හොඳම පියවරක් ලෙස සැලකිය හැකිය.

මිනිසුන් විසින් වගා කටයුතු සඳහා යොදා ගනු ලබන ප්‍රදේශවල පවතින කුඩා කැලෑ බිම් තීරු වාසභූමි කරගෙන අලි ස්වල්ප දෙනෙකු ජීවත්වෙනු දක්නට ලැබේ. මෙවැනි කුඩා අලි කණ්ඩායම් වලට දිගුකාලීන රැකවරණය ලබාදීම සඳහා ඔවුන් අල්ලාගෙන රක්ෂිත ප්‍රදේශවලට මුදාහැරීම හෝ ඔවුන් රක්ෂිත ප්‍රදේශ වලට එළවීම කළ යුතු වුවත් ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. මේ නිසා අපගේ පැරණි ප්‍රයත්න වෙනුවට නවීකරණය වූ අදහස් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සිතා බැලීම අවශ්‍ය වී තිබේ.

අලි සංරක්ෂණය පිළිබඳව වැඩි අවධානය යොමු වන අතරම අනෙකුත් වඳ වෙමින් පවතින සත්ව විශේෂ රැක ගැනීම පිළිබඳවද අවධානය යොමු කළ යුතුව තිබේ. මේ අනුව ලොකයේ වඳවෙමින් පවතින සත්ව විශේෂයක් වන කැස්බෑවන් සංරක්ෂණය කෙරෙහිද දෙපාර්තමේන්තුවේ දැඩි අවධානය යොමු වී තිබේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව දකුණු වෙරළ තීරයේ බූන්දල ජාතික වනෝද්‍යායේ සිට රුහුණු ජාතික වනෝද්‍යානය තෙක් ස්ථාන ගණනාවක් කැස්බෑ බිත්තර සංරක්ෂණය සඳහා ව්‍යාපෘති පිහිටුවා තිබේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙන්නේ රැකව පිහිටි ප්‍රධාන කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතියට අමතර වශයෙනි. මෙහිදී ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගයද ලබාගෙන රාත්‍රී කාලයේදී මෙම කැස්බෑ කූඩු ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

කැස්බෑවන් මූලික කරගෙන සිදු කරනු ලබන පාරිසරික සංචාරක ව්‍යාපෘතිවලදී ප්‍රදේශයේ ජනතාවගේද සහයෝගය ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. ස්වභාව සංරක්ෂණයේදී කැස්බෑවන් හොඳම රාජදූතයන් ලෙස හැඳින්විය හැකිය. ඔවුන් වගා කටයුතු වලට මැදිහත් වී හානි සිදු නොකරන අතර ඔවුන්







මුලුමනින්ම අහිංසක සත්ත්ව විශේෂයකි. පාරිසරික සංචාරක කටයුතු මූලික කරගෙන කැස්බෑ සංරක්ෂණ වැඩපිළිවෙල දියත් කිරීමෙන් නියත වශයෙන් ජනතාවට එය හොඳ ආදායම් මාර්ගයක් ද බවට පත්වේ.

පාරිසරික සංචාරක කටයුතු මගින් වනජීවින් සහ ස්වාභාවික සම්පත් සංරක්ෂණය කළ හැකි වනවා මෙන්ම ශ්‍රී ලංකාව විශාල ජෛව විවිධත්වයට උරුමකම් කියන ලෝකයේ වැදගත් ස්ථානයක් බවට පත්කිරීමේ හැකියාව ඇත. දහස් ගණන් දේශීය සහ විදේශීය සංචාරකයන් පින්නවල අලි අනාථාගාරයේ අලින් රැකවරණය ලබන අයුරු නැරඹීම සඳහා වාර්ෂිකව පැමිණෙති. වලි අලින් නිතරම සංචාරයන්ගේ ආකර්ෂණය ලබාගන්නා සත්ත්ව විශේෂයකි. රුහුණ, මින්නේරිය, කවුඩුල්ල, ගල්ඔය, ලාහුගල කිතුලාන, වස්ගමුව සහ උඩවලව ජාතික වනෝද්‍යාන තුල වල් අලින් බෙහෙවින් ගැවසෙති. එසේම බුන්දල ජාතික විනෝද්‍යානය දේශීය සහ සංචාරක පක්ෂින් දැක බලාගැනීමට තෝතැන්නකි. හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානය ගෝනුන්ට සහ දිවියන්ට විශේෂිත වූ ස්ථානයක් ලෙස පිළිගැනේ. සිංහරාජ වනාන්තරය ආවේණික විශේෂ රාශියකට වාසස්ථාන සපයයි. ශ්‍රී ලංකාව සත්‍ය වශයෙන්ම පාරිදීසයක් වැනිය. එහෙත් පරිසර සංචාරකයින් පරිසර නීති පිළිනොපැද්දොත් එය මිහිපිට නිරයක් බවට පත්වේ. මේ නිසා වඩා වැගත්වන්නේ පාරිසරික සංචාරක වැඩසටහන්වලදී මහජනතාවට ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳව අධ්‍යාපනය ලබාදීමය. පරිසර සංචාරය දැනුම පිණිස මිස විනෝදය සඳහා නොවේ. එබැවින් අපගේ ජාතික වනෝද්‍යාන සහ ස්වභාව රක්ෂිත විනෝදය සඳහාවූ ඩිස්නිලන්තයක් නොවිය යුතුය යන පණිවිඩය සංචාරක පිරිස් වෙත අධ්‍යාපනය තුළින් අවබෝධ කළ යුතුව ඇත.

ස්වභාව සම්පත් කළමණාකරනය වැඩි දියුණු කිරීම මූලික කරගත් පර්යේෂණ ක්‍රමවේදයන් පිළිගැනීම කෙරෙහිද අපගේ අවධානය යොමුවිය යුතුව ඇත. ස්වභාව සම්පත් කළමණාකරනය සාර්ථක කරගැනීමට නම් අපට නව ක්‍රමවේදයන් කරා යොමු වීමට සිදුවේ. 20 වන සියවසේ සංරක්ෂණ ක්‍රමෝපායන් 21 වන සියවසට ප්‍රමාණවත් නොවිය හැකිය. ස්වභාව සම්පත් කළමනාකරණය සඳහා අපට නව එළඹීම් කෙරෙහි අවධානය යොමු කිරිමට සිදු වී තිබේ. සංරක්ෂණයේ ඵලදායි ලගාවීම් සඳහා රටේ සියලුම අදාළ වෘත්තින් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ අත්වැල් බැඳගැනීමට දැන් කාලය එළඹ තිබේ. සංවර්ධනයේ දී පිරිසිදු ජලය, පිරිසිදු වාතය සහ පිරිසිදු පරිසරය සමග සංවර්ධන ඉලක්කයන් කරා ලභාවීම සැබෑ සංවර්ධනයක් ලෙස අපට සැලකිය නොහැකිද.

දයානන්ද කාරියවසම්

